Learning Resource Center
R
De Mazenod College
Kandana
17 JUL 2019

# ද මැසිනොද් විදුහල - කඳාන

## තෙවනවාර පරීක්ෂණය - 2019

### භූගෝල විද්‍යාව - I

13 ශ්‍රේණිය

කාලය - පැ. 03


මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 03 කින් යුක්ත වේ. I කොටස බහුවරණ ප්‍රශ්න 40 කින් යුක්ත වේ. II කොටසෙහි ප්‍රශ්න 02වම පිළිතුරු සැපයිය යුතුය. III කොටස ප්‍රශ්න 03 කින් සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න 02කට පමණක් පිළිතුරු සැපයිය යුතුය.

## I කොටස

- සුදුසු පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. 1:50 000 මෙට්‍රික් සිතියමක නිරිත කාර්තුවේ දිග, පළල පිළිවෙලින් 8 cm , 12 cm නම් එහි සැබෑ දිග, පළල හා වර්ගඵලයේ km ප්‍රමාණයන් වන්නේ,
   - i. 8 km , 12 km , 96 km$^2$
   - ii. 4 km , 6 km , 24 km$^2$
   - iii. 8 km , 12 km , 24 km$^2$
   - iv. 4 km , 6 km , 96 km$^2$
   - v. 2 km , 3 km , 16 km$^2$

02. පහත රූප සටහන් නිවැරදිව අනුපිළිවෙලින් නම් කර ඇති පිළිතුර වන්නේ,




   - i. මොහොර , කඳුවැටිය, නෙරුව, නිම්නය
   - ii. නිම්නය , නෙරුව, මොහොර, කඳුවැටිය
   - iii. කපොල්ල , නෙරුව, නිම්නය, මොහොර
   - iv. මොහොර, නිම්නය, නෙරුව, කඳුවැටිය
   - v. අවතල බෑවුම, කඳුවැටිය, නෙරුව, නිම්නය

03. ශ්‍රී ලංකාවේ මෙට්‍රික් සිතියම් ජාලය නිර්මාණයට යොදාගත් පාද ලක්ෂ්‍යය වන්නේ,
   - i. සමනළ කන්ද
   - ii. පේදුරුතුඩුව
   - iii. දෙවුන්දර තුඩුව
   - iv. පිදුරුතලාගල කන්ද
   - v. සන්ගමන්කන්ද තුඩුව

04. 1:50 000 පරිමාණයට අඳින ලද සමචතුරශ්‍රාකාර ඉඩමක වර්ගඵලය 64 cm$^2$ නම් එම ඉඩමේ සැබෑ දිග, පළල හා වර්ගඵලය වන්නේ,
   - i. 12 km , 6 km , 78 km$^2$
   - ii. 4 km , 4 km , 16 km$^2$
   - iii. 4 km , 6 km , 24 km$^2$
   - iv. 8 km , 8 km , 64 km$^2$
   - v. 8 km , 41 km , 64 km$^2$

05. අඛණ්ඩව විහිදීමක් නැති සංඛ්‍යා හඳුන්වන්නේ,
   - i. ප්‍රාථමික දත්ත
   - ii. ද්විතියික දත්ත
   - iii. සන්තතික දත්ත
   - iv. විවික්ත දත්ත
   - v. අසමූහිත දත්ත

06. මධ්‍යාන්‍යය යනු?
   - i. දත්ත සමූහයක සාමාන්‍ය අගයයි.
   - ii. වැඩිම වාර ගනනක් යෙදී ඇති සංඛ්‍යාවයි
   - iii. දත්ත වැලක මැද අගයයි.
   - iv. උපරිම අගයයි.
   - v. අවම අගයයි.

07. දත්ත සමූහයක Q2 (2/4 ) ලෙස හඳුන්වන්නේ,
   - i. ඉහළ චාතුර්තකය
   - ii. පහළ චාතුර්තකය
   - iii. පරාසය
   - iv. අන්තර් චාතුර්තක පරාසය
   - v. මධ්‍යස්ථය

08. ජනගහණ ඝනත්වය පෙන්වීමට වඩා සුදුසු ප්‍රස්තාරික ක්‍රමය වන්නේ,
i. බහු රේඛා ii. ප්‍රතිශත තීරු iii. ද්විත්ව තීරු
iv. රේඛාංකිත සිතියම් v. සම සංඛ්‍යා රේඛා සිතියම්

09. සංයුතීන් පෙන්වීමට වඩා උචිත ප්‍රස්තාරික ක්‍රමය වන්නේ,
i. බහු රේඛා ii. සංයුක්ත තීරු iii. තීරු හා රේඛා ඒකාබද්ධ
iv. සම සංඛ්‍යා රේඛා v. රේඛාංකිත සිතියම්

10. විචල්‍යයන් දෙකක් වර්ෂ කිහිපයකදී වෙනස්වීමට සංසන්දනයට වඩා උචිත ප්‍රස්තාරික ක්‍රමය වන්නේ,
i. ප්‍රතිශත තීරු ii. සක් සටහන් iii. ද්විත්ව සිරස් තීරු
iv. තිත් සිතියම් v. සමානුපාතික වෘත්ත

11. ශ්‍රී ලංකාවේ පාරිසරික ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායන් සැකසීමේ ආයතනය වන්නේ,
i. ජාතික ජලජ සම්පත් ආයතනය ii. මධ්‍යම පරිසර අධිකාරිය iii. වියානා සම්මුතිය
iv. ජාතික ගොඩනැගිලි පර්යේෂණායතනය v. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව

12. ශ්‍රී ලංකාවට අදාළ විවිධ භූ විද්‍යාත්මක සිතියම් සැකසීමේ ආයතනය වන්නේ,
i. ජාතික ජලජ සම්පත් ආයතනය
ii. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව
iii. මධ්‍යම පරිසර අධිකාරිය
iv. ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනය
v. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

13. ලොව සක්‍රිය යමහල් වලින් 65% ක්ම පවතින්නේ,
i. ඉන්දියන් සාගරයේ ii. අරාබි මුහුදේ iii. පැසිපික් සාගරය අවට
iv. ආක්ටික් සාගරය අවට v. අප්‍රිකාව අවට

14. ලොව බහුලව ලැව්ගිනි ඇතිවන කලාපයක් වන්නේ,
i. පැසිපික් ගිනි වළල්ල ii. කැලිෆෝනියාව iii. ග්‍රීන්ලන්තය
iv. ශ්‍රී ලංකාව v. නුවරඑළිය

15. වලාකුලක සිට පෘථිවිය වෙතට සිදුවන විද්‍යුත් විසර්ජනය හඳුන්වන්නේ
i. වළා අකුණු ii. පෘථිවි අකුණු iii. වා අකුණු
iv. සංවහන අකුණු v. ගිනි අකුණු

16. පිලිපීනයට දකුණින් හමන චාසුළි හඳුන්වන්නේ,
i. ටයිෆුන් ii. සුළිසුලං iii. හරිකේන්
iv. බැගියෝ v. ටොනාඩෝ

17. ශ්‍රී ලංකාවේ පිහිටි දැඩි රක්ෂිතයක් වන්නේ,
i. හික්කඩුව ii. රිටිගල iii. විල්පත්තු iv. වස්ගමුව v. බුන්දල

18. ශාක කෙතුරුපාකාරය ඉදිකටු වැනි පත්‍ර සාහිතය. ශාක විශේෂ ගණන අඩුය. යටි රෝපණයක් නොමැත. මෙවැනි වෘක්ෂලතා ලක්ෂණ පවතින්නේ,
i. කාන්තාර බියෝමය ii. ටයිගා බියෝමය iii. සැවානා බියෝමය
iv. මධ්‍යධරණී බියෝමය v. සෞම්‍යය කලාපීය බියෝමය

17 JUL 2019
Learning Resource Center
R
De Mazenod College
Kandana

19. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා ගණන,
 i. 80 ii. 103 iii. 236 iv. 108 v. 112

20. අවසාදිත තට්ටු අතර තැන්පත් වූ ජලය හඳුන්වන්නේ,
 i. භූගත ජලය ii. මැග්මීය ජලය iii. සහජාත ජලය iv. උල්කා ජලය v. මතුපිට ජලය.

21. පෘථිවියේ ලවණ ජල ප්‍රතිශතය,
 i. 71% ii. 30.1% iii. 97.5% iv. 2.5% v. 0.4%

22. ගෝලීය හරිතාගාර වායු විමෝචනය වැඩිම ක්‍රියාවලිය වන්නේ,
 i. බලශක්ති භාවිතය ii. කර්මාන්ත iii. වන විනාශය
 iv. ප්‍රවාහනය v. කෘෂිකර්මාන්තය

23. මිහිකත සමුළුවේ ප්‍රධාන තේමාව වන්නේ,
 i. පරිසරය සුරැකීම ii. ආර්ථික සංවර්ධනය iii. පාරිසරික වර්ධනය
 iv. පරිසරය හා තිරසාර සංවර්ධනය v. දේශගුණ විපර්යාසයන් අවම කිරීම.

24. කාන්තාර ශාකයක දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ,
 i. දිගු මුල් තිබීම ii. මංසල කඳන් දැරීම iii. ස්ථාරයනය
 iv. කටු සහිත වීම v. සිහින් පත්‍ර තිබීම.

25. ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකරයෙන් ආරම්භ වී ගංගා ගලායාමේ රටාව හඳුන්වන්නේ,
 i. වලයාකාර ii. ජාලාකාර iii. අරීය
 iv. රේඛීය v. ශාඛීය

26. දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානය යනු ?
 i. සප්ටා සංවිධානය ii. සැෆ්ටා සංවිධානය iii. සාර්ක් සංවිධානය
 iv. ආසියානු සංවිධානය v. යුරෝපා සංවිධානය

27. දකුණු ආසියානු වරණීය වෙළෙඳ ගිවිසුම යනු?
 i. සප්ටා ii. සැෆ්ටා iii. සාර්ක්
 iv. ආසියානු v. යුරෝපා

28. ලෝක ප්‍රජාව එකම සමාජයක් බවට පත්වීම හඳුන්වන්නේ,
 i. කාර්මීකරණය ii. නවීකරණය iii. ගෝලීකරණය
 iv. යාන්ත්‍රිකරණය v. සුක්ෂමකරණය

29. ත්‍රාසජනක අත්දැකීම් ලබා ගැනීමට සිදු කරන සංක්‍රමණය හඳුන්වන්නේ ,
 i. සෞන්දර්ය සංචරණය ii. පාරිසරික සංචරණය iii. වික්‍රමයන් ආශ්‍රිත සංචරණය
 iv. ප්‍රතිමෝධක සංචරණය v. සංස්කෘතික සංචරණය

30. හික්කඩුව හා බේරුවල සංචාරක ප්‍රදේශ අයත් වන්නේ,
 i. පුරාතන නගර ii. උස්බිම් ප්‍රදේශ iii. මහ කොළඹ
 iv. දකුණු වෙරළ v. නැගෙනහිර වෙරළ

31. ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්ත ශාලාවක් පිහිටා ඇත්තේ
i. සෙවනගල
ii. පුත්තලම
iii. කොළඹ
iv. කටුනායක
v. පිළිමතලාව

32. පුත්තලම හැර සිමෙන්ති කර්මාන්තය ව්‍යාප්තව ඇති ප්‍රදේශයකි,
i. කන්තලේ
ii. කන්කසන්තුරේ
iii. කොළඹ
iv. කටුනායක
v. පිළිමතලාව

33. ශ්‍රී ලංකාවේ ඇපටයිට් නිධිය පිහිටා ඇත්තේ,
i. කයිකාවල
ii. ඉඳුරුව
iii. එප්පාවල
iv. පුල්මුඩේ
v. මුලතිව්

34. ශ්‍රී ලංකාවේ වෙස්මුහුණු කර්මාන්තය ව්‍යාප්තව ඇත්තේ,
i. පිළිමතලාව
ii. එප්පාවල
iii. අම්බලන්තොට
iv. අම්බලන්ගොඩ
v. කයිකාවල

35. ශ්‍රී ලංකාවේ පිත්තල කර්මාන්තය ව්‍යාප්තව ඇත්තේ,
i. වේවැල්දෙණිය
ii. පිළිමතලාව
iii. එප්පාවල
iv. කයිකාවල
v. දෙහිවල

36. පෙට්‍රෝලියම් මිල පාලනයට පිහිටුවාගත් ජාත්‍යන්තර සංවිධානය,
i. සාක්
ii. බිම්ස්ටෙක්
iii. ඔපෙක්
iv. එපෙක්
v. මොන්ට්‍රියෙල්

37. ඇපටයිට් පාෂාණය බහුලව යොදා ගැනෙන්නේ,
i. පිඟන් භාණ්ඩ නිපදවීමට
ii. වීදුරු නිපදවීමට
iii. පොහොර නිපදවීමට
iv. ප්ලාස්ටික් නිපදවීමට
v. යකඩ නිපදවීමට

38. ශ්‍රී ලංකාවේ ආර්ථිකයට බහුලව දායකත්වය ලබාදෙන ප්‍රධාන කර්මාන්තය වන්නේ,
i. සිමෙන්ති
ii. ඇඟළුම්
iii. ප්ලාස්ටික්
iv. ඇපටයිට්
v. ලුණු

39. සංචාරක කර්මාන්තය නිසා රටට ඇතිවන අයහපත් ප්‍රතිඵලයක් වන්නේ,
i. විවිධ ජාතීන් හා සංස්කෘතියන් හඳුනා ගැනීම
ii. විදේශීය ගැත්තන් බවට පත්වීම.
iii. විදේශීය භාෂා ඉගෙන ගැනීම
iv. රට ජාත්‍යන්තරයේ ප්‍රසිද්ධ වීම
v. සමාජීය හා සංස්කෘතික අගයන් හුවමාරු වීම.

40. කාබන් ප්‍රතිශතය 90% ට වැඩි ගල් අඟුරු වර්ගය වන්නේ,
i. ජනු ii. ප්‍රජනු iii. බිටුමිනස් iv. කාෂ්ඨක v. ආග්නේය

17 JUL 2019

## II කොටස

01. ශ්‍රී ලංකාවේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1:50 000 භූ ලක්ෂණ සිතියමකින් කොටසක් ඔබට සපයා ඇත. එම සිතියම ආශ්‍රිතව පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. ප්‍රදේශයේ මහා මාර්ගයේ දිග km වලින් ගණනය කරන්න. (ල.04)

ii. ප්‍රදේශයේ ජලවහන රටාව කුමක් ද? (ල.01)

iii. ප්‍රදේශයේ A,B,C,D ලෙස නම් කර ඇති භූ ලක්ෂණ මොනවා ද? (ල.04)

iv. ප්‍රදේශයේ ඊසාන කාර්තුවේ දිග, පළල හා වර්ගඵලය km වලින් ගණනය කරන්න. (ල.04)

v. ප්‍රදේශයේ භෞතික ලක්ෂණ 04 ක් හා සංස්කෘතික ලක්ෂණ 04 ක් ලියන්න. (ල.04)

vi. ප්‍රදේශයේ භූ විෂමතාවය හා මානුෂ ක්‍රියාකාරකම් අතර සම්බන්ධතාවය විස්තර කරන්න. (ල.03)

02. ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියමේ පහත සඳහන් ලක්ෂණ ලකුණු කර නම් කරන්න.

i. පැසිපික් ගිනි වළල්ල

ii. මැඩගස්කරය

iii. හොකයිඩෝ දූපත

iv. කොංගෝ වනාන්තරය

v. නයිල් ගංගාව

vi. වික්ටෝරියා විල

vii. ග්‍රීන්ලන්තය

viii. බටහිර ඉන්දීය කොදෙව් දූපත්

ix. එට්නා ගිනි කන්ද

x. ඉන්දු ඕස්ට්‍රේලියානු භූ තැටිය (ල.10)

## III කොටස

03. i. චන්ද්‍රිකා ප්‍රති බිම්භයක් යනු කුමක් ද? (ල.02)

ii. චන්ද්‍රිකා ප්‍රති බිම්භයක හා සිතියමක වෙනස පහදන්න. (ල.05)

iii. භූගෝලීය තොරතුරු පද්ධති තාක්ෂණය යනු කුමක් ද? එහි ප්‍රයෝජන 03 ක් ලියන්න. (ල.05)

iv. GPS තාක්ෂණයේ ප්‍රයෝජන 03 ක් ලියන්න. (ල.03)

04. 2018 මාර්තු 28 දින ලංකාවේ තෝරාගත් මධ්‍යස්ථාන 15 ක උෂ්ණත්වය පහත වගුවෙන් දැක්වේ.

| මධ්‍යස්ථානය | උෂ්ණත්වය $^0C$ |
|---|---|
| කුරුණෑගල | 36.4 |
| මහඉලුප්පල්ලම | 35.6 |
| මන්නාරම | 32.7 |
| නුවරඑළිය | 21.1 |
| පුත්තලම | 33.8 |
| පොතුවිල් | 30.8 |
| රත්මලාන | 32.1 |
| ත්‍රිකුණාමලය | 34.6 |
| මොණරාගල | 31.5 |
| බදුල්ල | 27.3 |
| බණ්ඩාරවෙල | 23.8 |
| හම්බන්තොට | 31.8 |
| යාපනය | 33.8 |
| කටුගස්තොට | 27.8 |

Learning Resource Center R De Mazenod College Kandana

i. ඉහත වගුවට අනුව,

a) මධ්‍යනාය b) මධ්‍යස්ථය c) අන්තර්චාර්තුක පරාසය ගණනය කරන්න.(ල.08)

ii. දත්තවලට අනුව විසරණ සටහන නිර්මාණය කරන්න. (ල.04)

iii. උෂ්ණත්ව රටාවේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ල.03)

05. i. ශ්‍රී ලංකාවේ වයස් ව්‍යුහය අනුව ස්ත්‍රී පුරුෂ ජන සංඛ්‍යාව දැක්වීමට සුදුසු ප්‍රස්තාරික ක්‍රමය කුමක් ද? (ල.02)

ii. පහත දැක්වෙන්නේ 2016 වර්ෂයේ වයස් කාණ්ඩ අනුව ස්ත්‍රී පුරුෂ ජන සංඛ්‍යාවයි. එම දත්ත වලට අනුව සුදුසු ප්‍රස්තාරයක් නිර්මාණය කරන්න. (ල.08)


| වයස් කාණ්ඩය | පුරුෂ (දහස්) | ස්ත්‍රී (දහස්) |
|---|---|---|
| 0 - 4 | 78 250 | 79 400 |
| 5 – 9 | 69 400 | 72 200 |
| 10 – 14 | 62 500 | 69 300 |
| 15 – 19 | 56 300 | 62 600 |
| 20 – 24 | 48 250 | 57 200 |
| 25 – 29 | 40 100 | 52 500 |
| 30 – 34 | 36 500 | 49 250 |
| 35 – 39 | 27 450 | 40 150 |
| 40 – 44 | 21 200 | 39 500 |
| 45 – 49 | 18 450 | 36 250 |
| 50 – 54 | 16 300 | 28 400 |
| 55 – 59 | 12 100 | 25 200 |
| 60 – 64 | 10 500 | 22 250 |
| 65 – 69 | 8750 | 20 370 |
| 70 – 74 | 5 320 | 17 600 |
| 75 – 79 | 2 500 | 10 250 |
| 80 ට වැඩි | 1 001 | 8 475 |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

iii. ඉහත ප්‍රස්තාරයට අනුව ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යුහයේ කැපී පෙනෙන ලක්ෂණ මොනවා දැයි ලියන්න. (ල.03)

iv. එම ප්‍රස්ථාර ක්‍රමයේ ප්‍රයෝජන මොනවා ද? (ල.02)

17 JUL 2019



Learning Resource Center
R
De Mazenod College
Kandana

Learning Resource Center
R
De Mazenod College
Kandana
18 JUL 2019

# ද මැසිනොද් විදුහල - කඳාන

## තෙවනවාර පරීක්ෂණය - 2019

## භූගෝල විද්‍යාව - II

13 ශ්‍රේණිය කාලය - පැ. 03

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් සමන්විත වේ. අවම වශයෙන් එක් කොටසකින් ප්‍රශ්න දෙකක් වත් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

## I කොටස - භෞතික භූගෝල විද්‍යාව

01. i. වර්තමානය වනවිට ලොව බොහෝ රටවල් දරුණු පාරිසරික අර්බුද වලට මුහුණ දී තිබේ. ඒවාට හේතු මොනවා දැයි පහදන්න. (ල.04)
ii. පරිසර සංරක්ෂණයට ගතහැකි ක්‍රියාමාර්ග 03 ක් විස්තර කරන්න. (ල.06)
iii. ලෝක පරිසර සංවිධාන 03 ක් නම් කර ඉන් එකක භූමිකාව පැහැදිලි කරන්න. (ල.06)
iv. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මකවන පාරිසරික සංවිධාන හෝ ආයතන 04 ක් නම් කරන්න. (ල.04)

02. i. ස්වභාවික උපද්‍රවයක් හා ආපදාවක් යන්න පැහැදිලි කරන්න. (ල.04)
ii. ස්වභාවික උපද්‍රව සිදුවන ක්ෂේත්‍ර අනුව වර්ග කර ඇත. එම වර්ගීකරණය දක්වා උදාහරණ දෙක බැගින් ලියන්න. (ල.06)
iii. ලොව දරුණු ස්වභාවික උපද්‍රව 04 ක් නම් කර ඉන් 02 ක් පැහැදිලි කරන්න. (ල.06)
iv. ස්වභාවික උපද්‍රව නිසා භෞතික හා මානුෂ පරිසරයට ඇතිවන බලපෑම් 04 ක් ලියන්න. (ල.04)

03. i. ශ්‍රී ලංකාවේ ජලය ලබා ගන්නා මූලාශ්‍ර මොනවා ද? (ල.04)
ii. ජල සම්පත් අධිභාවිතය යනු කුමක් ද? ශ්‍රී ලංකාවේ ජල සම්පත් අධිභාවිතා වන ආකාර මොනවා ද? (ල.06)
iii. ශ්‍රී ලංකාවේ මිනිස් ක්‍රියාකාරකම් නිසා ජලය දූෂණය වන ආකාර 6ක් ලියා ඉන් 3ක් පැහැදිලි කරන්න. (ල. 06)
iv. ශ්‍රී ලංකාවේ ජල සංරක්ෂණයට ගත හැකි ක්‍රියාමාර්ග 03 ක් පහදන්න. (ල.04)

04. i. ආපදා කළමනාකරණය යනු කුමක් ද? එලෙස ආපදාවක් කළමනාකරණය කිරීම අවශ්‍ය වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ල.04)
ii. ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණයට ඇඩි ලෙස දායක කරගන්නා ආයතන 04ක් නම් කර ඒවායේ කාර්යභාරය කෙටියෙන් පහදන්න. (ල.06)
iii. ආපදා කළමනාකරණචක්‍රයේ පියවර නම් කරන්න. (ල.04)
iv. ශ්‍රී ලංකාවට බලපාන එක් ආපදාවක් නිදසුන් ලෙස ගෙන එය කළමනාකරණය කරගන්නා ආකාරය අපදා කළමනාකරණ චක්‍රයට අනුව පහදන්න. (ල.06)

## II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

05. i. කලාපීය සංවිධානයක් යනු කුමක් ද? ඒවාට උදාහරණ 03 ක් ලියන්න. (ල.04)
ii. එක් කලාපීය සංවිධානයක් තෝරාගෙන එය ආරම්භය අයත් රටවල්, අරමුණු හා කාර්යයන් විස්තර කරන්න. (ල.08)
iii. කලාපීය සංවිධානයකින් රටකට ලැබෙන ප්‍රතිලාභ මොනවා ද? (ල.04)
iv. ශ්‍රී ලංකාව සාමාජිකත්වය ලබා ඇති කලාපීය සංවිධාන මොනවා ද? (ල.04)

06. i. ගෝලීකරණය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.ගෝලීකරණ ක්‍රියාවලිය සිදුකරන මූලික අංශ 04 නම් කරන්න. (ල.06)
ii. ගෝලීකරණයේ ප්‍රධාන අංග නම් කරන්න. (ල.02)
iii. ගෝලීකරණයේ වාසි මොනවාදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල.06)
iv. ගෝලීකරණයේ අවාසි මොනවාදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල.06)

07. i. ශ්‍රී ලංකාවට සංචාරකයින් පැමිණීමේ අරමුණු 03 ක් විස්තර කරන්න. (ල.04)
ii. ශ්‍රී ලංකාවේ සංචරණයේ ප්‍රභේද 04 ක් නම්කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.06)
iii. සංචාරක කර්මාන්තය නිසා ශ්‍රී ලංකාවේ සමාජ හා සංස්කෘතිය කෙරෙහි ඇතිවන බලපෑම් 04 ක් විස්තර කරන්න. (ල.06)
iv. ශ්‍රී ලංකාවේ මෑතක සිදුවූ ත්‍රස්ත ප්‍රහාරයන් නිසා සංචාරක කර්මාන්තය බිඳ වැටී ඇත.එය යලි ගොඩනැගීමට ගතහැකි ක්‍රියාමාර්ග 04 ක් යෝජනා කරන්න. (ල.04)

08. i. ශ්‍රී ලංකා ආර්ථිකයට ඛනිජ සම්පත් වල වැදගත්කම උදාහරණ සහිතව විස්තර කරන්න. (ල.04)
ii. ශ්‍රී ලංකාවේ වටිනා ඛනිජ සම්පත් 05 ක් නම්කර ඉන් 03 ක් ව්‍යාප්ති ප්‍රදේශ 02 ක් හා ලබා ගන්නා ප්‍රයෝජන 02 ක් නම් කරන්න. (ල.06)
iii. ඛනිජ සම්පත් උපයෝජනයේදී ඇතිවන පාරිසරික බලපෑම් මොනවා දැයි උදාහරණ සහිතව පැහදිලි කරන්න. (ල.06)
iv. එම බලපෑම් අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග මොනවා ද? (ල.04)